(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

**අංක 31.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2024 ජූනි 19 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

466/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාතේ, එක් එක් පළාත් පාලන ආයතනය විසින් කුණු කසළ බැහැර කරනු ලබන ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ වනවිට බස්නාහිර පළාතේ විශාල වශයෙන් කුණු කසල එක්රැස් වී ඇති ස්ථාන සංඛ්‍යාව සහ ඒවා පිහිටා ඇති ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ස්ථාන අවට ජීවත් වන ජනතාවට පාරිසරික ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී තිබෙන බව දන්නේද;

(iv) එම ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

511/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද දිනය කවරේද;

(ii) එම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම වෙළඳ සංකීර්ණය කඩිනමින් විවෘත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

542/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාංශය යටතේ පවතින පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම පුහුණු මධ්‍යස්ථාන විසින් පවත්වනු ලබන පාඨමාලා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2020 සිට මේ දක්වා විදේශ ගත වී ඇති පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට පුහුණු /නුපුහුණු ශ්‍රමිකයන් ඉල්ලුම් කර ඇති රටවල් සහ ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

565/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන එම දෙපාර්තමේන්තුවට අයත් සේවකයන් සංඛ්‍යාව සහ ඒකාබද්ධ සේවයට අයත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒකාබද්ධ සේවයට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

590/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට කුරුල්ලන් ආනයනය කිරීම සඳහා අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, කුරුල්ලන් ආනයනය කිරීම සඳහා අනුමතිය ලබා දී ඇති රටවල් කවරේද;

(iii) එම අනුමතිය ලබා දීමේදී කුරුළු උණ රෝගයට අදාළ නිර්ණායකයන් සැලකිල්ලට ගෙන තිබේද;

(iv) එම අනුමතිය ලබා දීමේදී සලකා බලන ලද වෙනත් නිර්ණායක කවරේද;

(v) ආනයනය කරනු ලබන කුරුල්ලන්ගෙන් කුරුළු උණ රෝගය ව්‍යාප්ත වීමේ අවදානමක් තිබේ නම්, ඒ සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

611/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් ජනාධිපතිතුමා, ජනාධිපති ධූරයට පත්වීමෙන් පසු සහභාගී වී ඇති විදේශීය සංචාර කවරේද;

(ii) එම එක් එක් විදේශීය සංචාරයේදී හමු වූ විදේශීය රාජ්‍ය නායකයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම රාජ්‍ය නායකයන් සමඟ රාජ්‍ය තාන්ත්‍රික ගිවිසුම්වලට එළඹුණේද;

(iv) එසේ නම්, ගිවිසුම්වලට එළැඹි කාරණය එක් එක් ගිවිසුම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත සඳහන් එක් එක් විදේශීය සංචාරයේදී ජනාධිපතිතුමා සමඟ සහභාගි වූ සෙසු නියෝජිත පිරිස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම එක් එක් විදේශීය සංචාරය සඳහා රජය විසින් වියදම් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

636/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂයේදී රජයේ මැදිහත්වීම මත විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික සේවකයන් යොමු කර ඇති රටවල් කවරේද;

(ii) එම එක් එක් රට වෙත යොමු කර ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2023 වර්ෂයේදී රජයේ මැදිහත්වීමකින් තොරව විදේශ රැකියා සඳහා යොමු වී ඇති ශ්‍රී ලාංකික සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වර්ෂයේදී විදේශීය රැකියාවල නියුතු සේවකයන් විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර ඇති මුළු විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(v) ඉදිරියේදී විදේශීය රැකියා සඳහා ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයන් යොමු කරවීමට සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1092/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය' මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) ‘කිරි ගොවිපොළ 1000ක් පිහිටුවීමේ වැඩසටහන’ යටතේ මේ වනවිට පිහිටුවා ඇති කිරි ගොවිපොළ සංඛ්‍යාව කොපමණද;

(iii) එම කිරි ගොවිපොළවලින් වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන දියර කිරි ප්‍රමාණය කොපමණද;

(iv) මේ යටතේ ඉදිරියේදී පිහිටුවීමට නියමිත කිරි ගොවිපොළ සංඛ්‍යාව කොපමණද;

(v) මෙම වැඩසටහන සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අඛණ්ඩව ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1127/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදුලි ගාස්තු ඉහළ යාම හේතුවෙන් විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් දැඩි දුෂ්කරතාවයට පත් වී ඇති බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ සිටින විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා විසිතුරු මත්ස්‍යයන් අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1154/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට සිදු කරනු ලබන පුරාවිද්‍යා කැණීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන කවරේද;

(iii) එම කැණීම්/සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අඛණ්ඩව ලබා දෙන්නේද;

(iv) අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් මේ වනවිට කැණීම්/සංවර්ධන කටයුතු නවතා ඇති පුරාවිද්‍යා ස්ථාන කවරේද;

(v) ඉදිරියේදී කැණීම්/සංවර්ධනය කිරීමට යෝජිත පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ, වෙනත් රටවල අධිකරණවල නඩු තීන්දු ශ්‍රී ලංකාව තුළ අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා ද; (93 වන අධිකාරය වූ) විදේශ නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥාපනත සහ (94 වන අධිකාරය වූ) නඩු තීන්දු අන්‍යෝන්‍යාව බලාත්මක කිරීමේ ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 3 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ රෙගුලාසි,— 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 4 වගන්තිය යටතේ කැසිනෝ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 12 දිනැති අංක 2366/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.02 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ නියමය,— 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 4 වගන්තිය යටතේ කැසිනෝ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 පෙබරවාරි 02 දිනැති අංක 2369/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.02 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ නියෝගය,— 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 4 වගන්තිය යටතේ කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර නියෝග සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.18 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— පරිපූරක මුදල,— ශීර්ෂය 001 — වැඩසටහන 02 — † 2024 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන අටදහස් හත්සිය පනහක් (රු. 8,750,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළයුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **001** | - | අතිගරු ජනාධිපති | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන• | |
| | | | මූලධන වියදම් | රු. 8,750,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 8,750,000,000** |

• වැය ශීර්ෂ 001හි, වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහනෙහි, ව්‍යාපෘති අංක 06 - "ජාතික ප්‍රමුඛතාවයන් සඳහා ජාතික මට්ටමේ මහපෙන්වීම සහ සම්බන්ධීකරණය" ව්‍යාපෘතිය යටතේ වන අංක 024, 025, 026, 027, 028 සහ 032 උප ව්‍යාපෘතීන්හි උපයෝජනය නොවේයැයි අපේක්ෂිත ප්‍රතිපාදන, අංක 003 උප ව්‍යාපෘතිය වෙත මාරු කිරීමෙන්, මෙම රුපියල් මිලියන අටදහස් හත්සිය පනහක (රු.8,750,000,000) ප්‍රතිපාදන සලසනු ලැබේ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2024 ජූනි 07 දින ඉදිරිපත් කරන ලද 2024 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*6.

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— පොල් සංවර්ධන පනත යටතේ යෝජනා සම්මතය,— මෙහි උප ලේඛනයේ දැක්වෙන සංයෝජන වර්ගීකරණ සංකේත 1404-90-93 දරන HS කේතයෙන් අපනයනය කරනු ලබන I වැනි තීරුවෙහි සඳහන් සම්පීඩනය නොකරන ලද හා සම්පීඩනය කරන ලද කොහුබත් වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවෙහි දැක්වෙන ප්‍රමාණය මත සෙස් බද්දක් අයකළ යුතු බවට, පැනවිය යුතු බවට සහ ගෙවිය යුතු බවට 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 33වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

උපලේඛනය

| | | *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|---|---|
| ශීර්ෂ අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය (HS කේතය) | පොල් නිෂ්පාදනය | සෙස් බදු ප්‍රමාණය |
| | 1404-90-93 | සකසන ලද කොහු බත් (සම්පීඩිත හෝ සම්පීඩිත නොවන) | කිලෝ ග්‍රෑමයට ශත 10 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2024 ජූනි 04) [1].

*8.

යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 24 දිනැති අංක 2324/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නිවේදනය,— 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 24 දිනැති අංක 2368/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.02 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් ප්‍රදේශයේ ස්ථාපිත "විශේෂිත රෙදිපිළි නිෂ්පාදන කලාපය" සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 මාර්තු 28 දිනැති අංක 2377/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.05.14 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව (2021),— 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 154(6) වගන්තිය යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමෙහි 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසර, ස්වභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.02.08 / 2024.02.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.03.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*22.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 වන අධිකාරය වූ) 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47(1) වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2023 මැයි 25 දින සාදනු ලදුව, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ටවර් හෝල් රඟහල පදනමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ (2021),— 1978 අංක 1 දරන ටවර් හෝල් රඟහල පදනම පනතේ 12(5) වගන්තිය යටතේ 2023.10.06 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ටවර් හෝල් රඟහල පදනමෙහි 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.01.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.01.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*24.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— නීති අධ්‍යාපන සහා ආඥාපනත යටතේ රීති,— (276 අධිකාරය වූ) නීති අධ්‍යාපන සහා ආඥාපනතේ 7 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලදුව, 2023 මැයි 15 දිනැති අංක 2332/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.18 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*25.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග (අංක 1),— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 නොවැම්බර් 27 දිනැති අංක 2360/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග (අංක 2),— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 පෙබරවාරි 13 දිනැති අංක 2371/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2023.12.13 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.01.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.03.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

28.

මාතර සමය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

29.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36.

විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40.

විවාහවීමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42.
අරුන්දික ප්‍රනාන්දු සහන සේවා සහ ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු අනුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43.
ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44.
හෙක්ටර් අප්පුහාමි හෙල්පින් හැන්ඩ් පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

45.
ජනරජ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---